# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2452/05 – 2025 සැප්තැම්බර් මස 02 වැනි අඟහරුවාදා – 2025.09.02**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2023/256.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ජේ. උපුල් රංජිත් මහතා, අංක 156, 06 වන පටුමග, පන්නිලකන්ද, කනන්විල, හොරණ.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමඟ, 34/64, ඒ.බී. හේරත් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2023/256.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජේ. උපුල් රංජිත් මහතා, අංක 156, 06 වන පටුමග, පන්නිලකන්ද, කනන්විල, හොරණ.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කරන ජේ. උපුල් රංජිත් මහතාට කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 ප්‍රකාරව තනතුරු ප්‍රතිව්‍යුහගත කිරීමේදී 2012.03.19 දිනට ලබාදී ඇති තනතුරු ශ්‍රේණිය හා වැටුප් පරිමාණය නිවැරදිද යන්න හා නිවැරදි නොවේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.".

**එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09 – 0005

---

මගේ අංකය: IR/COM/03/2024/71.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

වෛද්‍ය එම්.එස්.ආර්. විජේතුංග මහතා, අංක 330/4, මීගමු පාර, කුරුණෑගල.

සහ

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, අංක 170, හයිලෙවල් පාර, නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන්

මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාර, 117 සිරි සිංගප්පුලි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2024/71.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

වෛද්‍ය එම්.එස්.ආර්. විජේතුංග මහතා, අංක 330/4, මීගමු පාර, කුරුණෑගල.

සහ

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, අංක 170, හයිලෙවල් පාර, නුගේගොඩ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ කොන්ත්‍රාත් පදනම මත සේවය කළ වෛද්‍ය එම්.එස්.ආර්. විජේතුංග මහාතා හට 02/2016 කළමනාකරණ චක්‍රලේඛය අනුව වැටුප් ගෙවීමේදී හා මාසික ජීවන වියදම් දීමනාව ලබා දීමේදී අසාධාරණයක් සිදුවී ඇත්ද යන්නත් එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ඒ සඳහා ලබා දිය හැකි සහන කවරේද යන්නත් වේ."

**එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09 – 0006

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.